# සන්නස සාහිත්‍ය තරගාවලිය 2006

## ප්‍රතිඵල

### කෙටිකතා

**ප්‍රථම ස්ථානය**

*පළමුවැනි තෑග්ග*
**තුසිත් අබේනායක**

**දෙවන ස්ථානය**

*ගරාජ් සේල්*
**පද්මිණී තෝරකුඹුර**

**තෙවන ස්ථානය**

*පාරාදීසය*
**ශ්‍රියාණි පෙරේරා**

**සම්මාන සහතික**

*නිවැරදි මිනිසුන්*
**මේනකා ජයතිලක**

*තිස්ස සහ අලගන්*
**පද්මසිරි හේරත්**

ඉහත කෙටිකතා පහත් පහත දැක්වෙන කෙටිකතා පහත් ඇතුලත් කෙටිකතා සංග්‍රහය සන්නස ප්‍රකාශණයක් ලෙස මාස දෙකක් ඇතුළත එළි දක්වන්නට කටයුතු යොදා ඇති බව ද සතුටින් දන්වමු.

*වීරවංශ මහතාගේ කතා වස්තුව*
**හැරිස් පරකන්දෙණිය**

*ශානිකාගේ විප්ලවය*
**ර චන්ද්‍රසූරිය**

*තිනිවූ සිරියලතා*
**සුභාෂිණී හේරත්**

*පින් මද පුතුන්*
**දමින්ද දම්පහලගේ**

*කමලාවතීගේ ලෝකය*
**පුෂ්පිකා ගමගේ**

### කාව්‍ය

**ප්‍රථම ස්ථානය**

*මහළු පියාගේ*
**සුභාෂිණී හේරත්**

**දෙවන ස්ථානය**

*තාත්තාට*
**තුසිත් අබේනායක**

**තෙවන ස්ථානය**

*තිළිණය*
**රුක්මලී දසනායක**

**සම්මාන සහතික**

*නුඹත් මමත්*
**පද්මිණී තෝරකුමුර**

*කුකුබරා සන්දේශය*
**රසික සූරියආරච්චි**

*නොනැසෙන උරුමය*
**රුක්මලී දසනායක**

*රුවැත්තියක්*
**විජයසිරි තිලකුමාර**

*බවුන් වැඩීම*
**ර චන්ද්‍රසූරිය**

## ජයග්‍රාහී කෙටිකතා දහය පොතක් ලෙස ළගදීම

## සන්නස සාහිත්‍ය තරග 2007 ට දැන් සැරසෙන්න

ජයග්‍රාහකයන් තෝරා ගැනීම ස්වාධීන විනිශ්චය මණ්ඩලයක් මගින් සිදුකෙරුණි. විනිශ්චය මණ්ඩලයේ එක් එක් සාමාජිකයා විසින් තරගයට ඉදිරිපත් කෙරුණ කෘතී වෙන වෙනම අගය කිරීමකට ලක් කරන ලද අතර ඔවුන් ලබා දුන් ලකුණු වල සාමාන්‍යය ගෙන ජයග්‍රාහකයන් තෝරාගන්නා ලදී. මේ විනිශ්චය සම්බන්ධයෙන් සන්නස සංස්කාරක මණ්ඩලය විසින් කිසිදු බලපෑමක් නොකරන ලද බවද දන්වමු.

### අපේ විනිශ්චය මණ්ඩලය

#### ඩී බී කුරුප්පු

ඔස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකික ලේඛක පරපුරේ ඉදිරියෙන්ම සිටින ලේඛකයා ඔහු ය. අති දක්ෂ පරිවර්තකයෙකු වන ඩි බී මේ වන විට තිහකට වැඩි පොත් ප්‍රමාණයක් ලියා පළකර ඇත ඔහුගේ ජීවන චරිත කතාව ඇතුළත් හැන්දෑවට පායන හිරු මේ දින වල විශාල පාඨක අවධානයක් දිනා ගෙන ඇත.
මෙයට වසර තුනකට හතරකට පමණ පෙර, සාහිත්‍ය තරග මාලාවක් ඉදිරිපත් කිරීම පිළිබඳ අදහස පළමු වරට අපට ඉදිරිපත් කළ බව කෘතවේදීව සටහන් කර තබනු කැමැත්තෙමු.

#### වි ක ධර්මබන්ධු

ප්‍රවීණ ලේඛකයෙකි. සිංහල භාෂාව පිළිබඳ විශේෂඥයෙකි. සන්නස ඔස්සේ සිංහල භාෂාව පිලිබඳ අගනා පාඩම් මාලාවක් ඉදිරිපත් කරන ධර්මබන්ධු මහතා සඳකුරු වැල නමින් අලුත් සිංහල හෝඩියක් ද නිර්මාණය කර ඇත.

#### පාලිත ගනේවත්ත

ප්‍රවීණ ලේඛකයෙකි. දක්ෂ මාධ්‍ය වේදියෙකි. සිඩ්නි සිට එස්බීඑස් ගුවන් විදුලියේ සිංහල වැඩ සටහන මෙහෙයවන පාලිත කෙටිකතා හා කාව්‍ය ග්‍රන්ථ කීපයක්ම ලියා පල කොට ඇත. පාලිත සිය පළමු නවකතාව මේ මාසයේදී නිකුත් කරන්නට යයි.

#### ඩබ් එච් උපසේන

ලේඛකයකු පරිවර්තකයකු වශයෙන් වසර 15 ක පමණ පළපුරුද්දක් ඇති ඔහු ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වැඩ සටහන් නිශ්පාදකයකු, පිටපත් හා ගුවන් විදුලි නාට්‍ය රචකයකු , වැඩ සටහන් මෙහෙයවන්නකු වශයෙන් වසර 10 ක් පමණ සේවය කර ඇත. කැළණිය විශ්ව විද්‍යාලෙයේ ජන සන්නිවේදනය පිළිබඳ විශේෂ උපාධිධාරියකු වන ඔහු ශ්‍රී ජයවරධන විශ්ව විද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක්ද ලබා ගෙන ඇත.

සන්නස සාහිත්‍ය තරගාවලිය 2006 ට සහභාගිවූ සියලුම ලේඛකයනටත් ලේඛිකාවනටත් අපේ ස්තුතිය හිමි වෙයි. තරගාවලිය ඉතා දැඩි තරගකාරී බවකින් යුතු විය. එබැවින් මේ තරගාවලියේදී ජය ලබන්නට නොහැකි වූ පමණින් ඔබේ නිර්මාණ අවතක්සේරුවකට ලක් නොවෙයි.
**2007 සන්නස සාහිත්‍ය තරග සඳහා දැන් සූදානම් වන්න**


ට්‍රාන්ස්කෝ
ගමටම ඇවිත්
The leaders in personal effects shipping to Sri Lanka

Hampton Park හැම්ටන් පාක්
Narre Warren නරේවරන්
Cranbourne ක්‍රැන්බර්න්
Berwick බෙරික්
Hallam හැලම්

All Spices - St Albans
Quality Spices - Noble Park
Kandy Spices - Hampton Park
Lakbima - Dowton
Aussie Spices - Narre Warren

Jagath JE - Sannasa

පෙට්ටි ඩොලර් 20 සිට
Buy 2 Get one FREE
Free Delivery & Pickup

Transco

ඇෂ්ලි
9704 5091
0416 26 26 09
15 Eureka Cres
Narre Warren Vic 3805